# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2083/7 – 2018 අගෝස්තු මස 07 වැනි අඟහරුවාදා – 2018.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මාතලේ ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියෙන් දෙවන උප වගන්තියෙන් පැවරී, ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උප වගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,

2018 පෙබරවාරි මස 14 වැනි දින,
පල්ලෙකැලේ දී ය.

1A – G 28235 – 32 (2018/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක (2) 1 වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු අය කිරීම සඳහා විනෝද කටයුතු සිදු කරන සෑම තැනැත්තෙකුගෙන්ම එය සිනමා සංදර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් 15% ක ප්‍රමාණයකට සමාන ප්‍රමාණයක්ද වෙනත් සියලු විනෝද සංදර්ශන වන විට ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් 20% මුදලක්ද අය කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව.

08-719/1

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

තලවකැලේ ලිඳුල නගර සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තලවකැලේ ලිඳුල නගර සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියෙන් දෙවන උප වගන්තියෙන් පැවරී, ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උප වගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,

2018 මාර්තු මස 13 වැනි දින,
පල්ලෙකැලේ දී ය.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක 2 (1) වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ විනෝද බදු අය කිරීම සඳහා තලවකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශය තුළ විනෝද කටයුතු සිදු කරන සෑම තැනැත්තෙකුගෙන්ම එය විනෝද සංදර්ශන වන විට ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකරගන්නා මුදල් ප්‍රමාණයෙන් 15% ක ප්‍රමාණයකට බද්දක් අයකිරීමට නගර සභා පනතේ 27(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන්නීය.

08-719/2

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

නාඋල ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව නාඋල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියෙන් (2) වන උප වගන්තියෙන් පැවරී, ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උප වගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,

2018 පෙබරවාරි මස 14 වැනි දින,
පල්ලෙකැලේ දී ය.